# Sight For All

## ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති කරුණු පත්‍රිකාව

ළමයින්ට අපයෝජනයෙන් සහ සූරාකෑමෙන් නිරුපද්‍රිත වීමට සහ ආරක්ෂිත වීමට අයිතියක් ඇත. දරුවන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව සියලු ජන කොටස්වලට අත්‍යවශ්‍ය වේ. ලොව පුරා සිටින ළමුන් සූරාකෑමට හා අපයෝජනයන්ට ලක්වන අතර ලිංගික, කායික සහ මානසික හිංසනයන්ට ලක් වේ. බොහෝ දෙනෙකු වාණිජ ලිංගික සූරාකෑම ඇතුළු අයථා කටයුතුවලට බලහත්කාරයෙන් යොදවනු ලැබෙයි.

Sight For All ළමා අපචාර සහ ළමා සූරාකෑම සෑම අවස්ථාවකදීම පිළිගත නොහැකි බව සලකයි. ළමයින්ට අපයෝජනයෙන් සහ සූරාකෑමෙන් නිරුපද්‍රිත වීමට සහ ආරක්ෂා වීමට අයිතියක් ඇති අතර, Sight For All ළමා අපයෝජන සහ සූරාකෑම සම්බන්ධයෙන් දරනුයේ ශූන්‍ය ඉවසීමේ (zero-tolerance) ප්‍රවේශයකි.

Sight For Allහි ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය ළමුන් ඇතුළුව ඒ සමඟ වැඩ කරන අයගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා පවතී.

මෙම තොරතුරු පත්‍රිකාව Sight For Allහි ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයන නමුත්, එය එම ප්‍රතිපත්තිය ප්‍රතිස්ථාපනය නොකරයි.

Sight For All ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය පහත සඳහන් අයද ඇතුළුව සියලුම Sight For All පුද්ගලයින් සඳහා අදාළ වේ: අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරුන්, සේවකයින්, වෛද්‍ය ස්වේච්ඡා සේවකයන් (දෘෂ්ටිකයන්), වෛද්‍ය නොවන ස්වේච්ඡා සේවකයන්, අක්ෂි සායනික නිලධාරීන්, සාමාජිකයින්, ව්‍යාපෘති සහභාගිවන්නන්, අක්ෂි ඒකක අධ්‍යක්ෂවරුන් , කොන්ත්‍රාත්කරුවන්, Sight For All ව්‍යාපෘති සමඟ සම්බන්ධ වී සිටින රට තුළ සිටින නියෝජිතයන් සහ Sight For All ව්‍යාපෘති සඳහා විධිමත් ගිවිසුම් සබඳතාවක් ඇති සියලුම ව්‍යාපෘති හවුල්කරුවන්.

### ප්‍රතිපත්තිය මූලධර්ම පහකින් සමන්විත වේ:

මූලධර්මය 1: ළමා සූරාකෑම සහ අපයෝජනය සම්බන්ධ ශූන්‍ය ඉවසීම
මූලධර්මය 2: දරුවාගේ හොඳම අවශ්‍යතා
මූලධර්මය 3: අවදානම් පිළිබඳ දැනුවත් කිරීම සහ කළමනාකරණය
මූලධර්මය 4: ළමා නිරාපදාව පිළිබඳ වගකීම්
මූලධර්මය 5: වාර්තා කිරීම සහ කාර්ය පටිපාටි සාධාරණත්වය

| |
|---|
| **මූලික අර්ථකථනය** |
| *ළමයින්:* |
| *ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුව, 'ළමයි' යනු දරුවාට අදාළ වන නීතිය යටතේ අඩු වයසකදී පූර්ණත්වය ලබන්නේ නම් මිස වයස අවුරුදු 18ට අඩු සියලු මනුෂ්‍යයන් ළමයින් ය.'* |
| අපයෝජනය: |
| **කායික අපයෝජනය**—දරුවාට හානියක් සිදු වන ආකාරයෙන් දරුවෙකුට එරෙහිව ශාරීරික බලය යෙදවීම. *ශාරීරික හිංසාකාරී හැසිරීම්වලට තල්ලු කිරීම, පහර දීම, කම්මුල් පහර දීම, සෙලවීම, විසි කිරීම, මිටින් පහර දීම, පයින් ගැසීම, සපාකෑම, පිළිස්සීම, ගෙල සිර කිරීම සහ වස දැමීම ඇතුළත් වේ.* |
| ***නොසලකා හැරීම***—*දෙමව්පියෙකු හෝ භාරකරුවෙකු විසින් දරුවෙකුට ඔවුන්ගේ ශාරීරික හා චිත්තවේගීය වර්ධනයට සහ යහපැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය යැයි සංස්කෘතික වශයෙන් පිළිගෙන ඇති තත්වයන් (ඔවුන්ට එසේ කළ හැකි පරිසරයකදී) සැපයීමට අසමත් වීම.* |
| ***චිත්තවේගීය අපයෝජනය***—*දරුවා කෙරෙහි මාපියෙකු හෝ භාරකරුවෙකුගෙන් දරුවාට නුසුදුසු වාචික හෝ සංකේතාත්මක ක්‍රියාවන් සිදුවීම හෝ දරුවාට කායික නොවන පෝෂණයක් සහ චිත්තවේගීය ප්‍රයෝජනයක් ලබා දීම සඳහා කාලයත් සමඟ ඔවුන් අසාර්ථක වීමේ රටාව. එවැනි ක්‍රියාවන් දරුවාගේ ආත්ම අභිමානය හෝ සමාජ නිපුණතාවයට හානි කිරීමේ ඉහළ සම්භාවිතාවක් ඇත.* |
| ***ලිංගික අපයෝජනය***—*වැඩිහිටියෙකු හෝ සැලකිය යුතු ලෙස වැඩිහිටි දරුවෙකු හෝ නව යොවුන් වියේ දරුවෙකු විසින් ළමයකු ලිංගික තෘප්තිය සඳහා යොදා ගැනීම. ලිංගික අපයෝජන හැසිරීම් අතරට* |

| |
|---|
| *ලිංගේන්ද්‍රිය සුරතල් කිරීම, ස්වයං වින්දනය, මුඛ සංසර්ගය, යෝනි මාර්ගයට හෝ ගුද මාර්ගයට ශිෂ්ණය, ඇඟිල්ලක් හෝ වෙනත් වස්තුවක් ඇතුළු කිරීම, පියයුරු සුරතල් කිරීම, සැඟවී බලා සිටීම, ප්‍රදර්ශණය කිරීම සහ දරුවා කාමුක දර්ශනවලට නිරාවරණය කිරීම හෝ සම්බන්ධ කිරීම ඇතුළත් විය හැකිය.* |
| *ළමා සූරාකෑම සහ අපයෝජනය: පහත එකක් හෝ කිහිපයක්:* |
| *- ළමයෙකුට එරෙහිව අපයෝජන ක්‍රියාවක් සිදු කිරීම හෝ එවැනි ක්‍රියාවක් හෝ ක්‍රියා සිදු කිරීමට වෙනත් පුද්ගලයෙකුට බලපෑම් කිරීම හෝ බල කිරීම.* |
| *- ළමා සූරාකෑමට අදාළ ද්‍රව්‍ය ළඟ තබා ගැනීම, පාලනය කිරීම, නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම, ලබා ගැනීම හෝ සම්ප්‍රේෂණය කිරීම.* |
| *- ලිංගිකව අපයෝජනය කිරීමේ අරමුණින් මිතුරුකම් පෑම හෝ වෙනත් පුද්ගලයෙකුට එවැනි ක්‍රියාවක් හෝ ක්‍රියාවන් කිරීමට හෝ මාර්ගගතව එවැනි ක්‍රියාවක යෙදීමට බල කිරීම.* |
| ළමා ආරක්ෂාව: |
| විශේෂයෙන් ළමා සූරාකෑම සහ අපයෝජනයෙන් ආශ්‍රිත ඕනෑම ආකාරයක හානියකින් ළමයින් ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය කර ඇති ක්‍රියාකාරකමක් හෝ මුලපිරීමක්. |
| |

## ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

Sight For All ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් දෑ ප්‍රධාන අවශ්‍යතා වේ. පහත දක්වා ඇති පරිචයන් හරහා ළමුන් සුරක්ෂිතව තබා ගැනීමට උත්සාහ කරයි.

බඳවා ගැනීමේ පිළිවෙත්

Sight For All හි අරමුණ වන්නේ තනතුරු භාර ගැනීම සඳහා ආරක්ෂිතම සහ වඩාත්ම සුදුසු සහ දරුවන්ට පිළිගත නොහැකි අවදානමක් ඇති පුද්ගලයෙකු සමඟ සෘජුව හෝ වක්‍රව කිසි විටෙකත් දැනුවත්ව සම්බන්ධ නොවන පුද්ගලයින් බඳවා ගැනීමයි.

පුහුණුව

සියලුම Sight For All අධ්‍යක්ෂ මණ්ඩලය, කාර්ය මණ්ඩලය, දෘෂ්ටිකයන්, ස්වේච්ඡා සේවකයන්, අක්ෂි සායනික නිලධාරීන්, සාමාජිකයින්, ව්‍යාපෘතිවලට සහභාගිවන්නන්, ව්‍යාපෘති හවුල්කරුවන්, උපදේශකයින් සහ කොන්ත්‍රාත්කරුවන් යන සියලු දෙනාට ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයින්ගේ චර්යාධර්ම සංග්‍රහයෙහි පිටපතක් ලැබෙන අතර ඔවුහු ඒවා කියවා අවබෝධ කරගෙන අත්සන් කළ යුතුය.

යහපත් සංවර්ධන පුරුදු වැඩමුළු පවත්වනු ලබන අතර ඊට ළමා ආරක්ෂාව පිළිබඳ පුළුල් කොටසක් ඇතුළත් වේ.

<u>හවුල්කරුවන්</u>

Sight For All හි සම්බන්ධ රාජ්‍ය නොවන හවුල්කරුවන් ඔවුන්ගේම ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති පවත්වා ගැනීම අවශ්‍ය වේ.

හවුල් ගිවිසුම්වලට ළමා ආරක්ෂණ ප්‍රමිතීන් ඇතුළත් බව සහතික කිරීම සඳහා රජයේ හවුල්කරුවන් සහ Sight For All එක්ව කටයුතු කරනු ඇත. ළමුන් සැලකිය යුතු අවදානමකට නිරාවරණය වන බව Sight For All කාර්ය මණ්ඩලයට ඒත්තු ගැන්වෙන සියලුම ක්‍රියාවන් එම හවුල්කාර සංවිධානය සමඟ ඇති ගිවිසුම අවසන් වීමට හේතු වේ.

<u>අවදානම් කළමනාකරණය</u>

ව්‍යාපෘති අවදානම් තක්සේරු කිරීම් ආරම්භයේ සහ සංකල්ප අදියරවල කොටසක් ලෙස සිදු කරනු ලබන අතර ව්‍යාපෘති කාලසීමාව පුරාවට නැවත ඇගයීමට ලක් කෙරේ. ව්‍යාපෘති අවදානම් තක්සේරු කිරීම් මගින් ළමා ආරක්ෂණ අවදානම් ආවරණය වන අතර විය හැකි අවදානම් අවම කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු සහ නිර්දේශ ඇතුළත් වේ.

ආයතනික මට්ටමින් ළමා ආරක්ෂණ අවදානම් නිරීක්ෂණය කිරීම Sight For All අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

## දරුවන්ගේ පින්තූර ගැනීම

ඡායාරූප ගැනීමේදී, Sight For All නියෝජිතයන් පුද්ගලයාගේ අභිමානයට ගරු කිරීමේ වැදගත්කම සහ ඡායාරූපවල පෙනී සිටින අයගේ අයිතිවාසිකම්, ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කිරීමේ

වැදගත්කම පිළිබඳ හොඳින් දැන සිටීම සහ අවබෝධ කරගෙන සිටීම අත්‍යවශ්‍යය. ඡායාරූප, සන්දර්භය සහ කරුණු පිළිබඳ තථ්‍ය නිරූපණයක් විය යුතු අතර පුද්ගලයා, සන්දර්භය, ස්ථානය හෝ තත්ත්වය වැරදි ලෙස නිරූපණය නොකළ යුතුය. Sight For All ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය එකඟත්වය පිළිබඳ සාක්ෂි සහිතව, ලබා ගන්නා ලද සියලුම පින්තූර සඳහා දැනුම්වත් අනුමැතිය ලබා දිය යුතුය.

## වාර්තා කිරීම

ළමා අපයෝජන සහ සුරාකෑම පිළිබඳ සියලු උත්සුකයන්, සැකයන් හෝ චෝදනා, මෙම ප්‍රතිපත්තියේ හෝ Sight For All's චර්යාධර්ම ප්‍රතිපත්තිය සම්බන්ධ උල්ලංඝනයක් වහාම වාර්තා කළ යුතුය. Sight For All සියලුම වාර්තා සහ උත්සුකයන් බැරෑරුම් ලෙස සලකන අතර වහාම ඒ සම්බන්ධව ක්‍රියා කරයි. ළමා අපචාර හෝ සුරාකෑම පිළිබඳ උත්සුකයන් හෝ චෝදනා විමර්ශනය කිරීමේදී, Sight For All රහස්‍යභාවය සහතික කරන අතර ස්වභාවික යුක්තියේ මූලධර්ම ආරක්ෂා කිරීමට වගබලා ගනු ඇත.

ඕනෑම කෙනෙකුට සැක සහිත හෝ සැබෑ ළමා අපයෝජන හෝ සුරාකෑම පිළිබඳ වාර්තා කළ හැකිය.

Sight For All ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය හෝ අවදානමට ලක්විය හැකි පුද්ගලයන්ගේ චර්යා ධර්ම සංග්‍රහය උල්ලංඝනය වන හැසිරීම් සම්බන්ධ ඕනෑම නිරීක්ෂණයක් වාර්තා කළ යුතුය. එබැවින් ළමා කාමුක දර්ශන හෝ ළමා සුරාකෑමේ ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම හෝ ප්‍රවේශ වීම පිළිබඳ සැකයක් හෝ චෝදනාවක්, ළමා ඡායාරූප නුසුදුසු ලෙස ගැනීම පිළිබඳ කිසියම් නිරීක්ෂණයක්, Sight For All ක්‍රියාකාරකම්වල නිරත වීමෙහි ප්‍රතිඵලයක් ලෙස දරුවන්ට සිදුවන යම් අවදානමක් හෝ හානියක් පිළිබඳ කවර හෝ සැකයක් හෝ චෝදනාවක් වාර්තා කළ යුතුය.

පැය 24ක කාලයක් තුළ වාර්තා ඉදිරිපත් කළ යුතුය.

**මා දැක ඇත්තේ ළමා සුරාකෑම සහ අපයෝජනය බව මට විශ්වාස නැත්නම් කුමක් කළ යුතුද?**

ළමා සුරාකෑම සහ අපයෝජනය හෝ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම යනු කුමක්ද යන්න පිළිබඳ රහස්‍ය උපදෙස් සහ වැඩිදුර තොරතුරු සඳහා ළමා ආරක්ෂණ කේන්ද්‍රීය පුද්ගලයා හෝ Sight For All සායනික නිලධාරියා අමතන්න.

**මම වාර්තාවක් කරන්නේ කෙසේ ද?**

https://sightforall.org/complaints/ මඟින් හෝ පහත සඳහන් Sight For All නියෝජිතයෙකු සමඟ සම්බන්ධ වීමෙන් වාර්තා කළ හැකිය:

Sight For All විධායක නිලධාරියා – jhatswell@sightforall.org
මොංගෝලියා/ශ්‍රී ලංකා/මියන්මාර් රටෙහි නිලධාරියා – myanmarcountryofficer@sightforall.org
කාම්බෝජ රටෙහි – cambodiacountryofficer@sightforall.org
ශ්‍රී ලංකා රටෙහි නිලධාරියා – srilankacountryofficer@sightforall.org